"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மார்க்கஸ் பர்ணாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 2698409
ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667
ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி / General Telephone 2682868, 2682869, 2682870

මගේ අංකය. / எனது இல. / My No. CSO/FIN/3/5/2014-01

ඔබේ අංකය. / உமது இல. / Your No.

දිනය. / திகதி. / Date. 2014.10.

<u>බස්නාහිර පළාත් සභා අයවැය චක්‍රලේඛ 4/2014 (i)</u>

බස්නාහිර පළාත් සභාවේ

සියලුම ලේකම්වරුන්,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ පිරිස් හා පුහුණු/ මූල්‍ය/ සැලසුම්/ ඉංජිනේරු),

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

අධිකාරිවල සභාපතිවරුන්,

## 2014 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම සහ රාජ්‍ය වියදම් කළමනාකරණය.

CSO/FIN/3/5/2014-01 හා 2014.04.04 දිනැති බස්නාහිර පළාත් අයවැය චක්‍රලේඛ 4/2014 බැඳේ.

02. පළාත් සභාවේ ඇතැම් කාර්යාල වල සේවාවන් පවත්වා ගෙන යාමේදී ඉහත චක්‍රලේඛයේ සීමා නිසා පැන නැගුණ විවිධ අපහසුතා සලකා පහත පරිදි කටයුතු කිරීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇත.

03. 2014.04.04 දිනැති 4/2014 බස්නාහිර පළාත් අයවැය චක්‍රලේඛයේ 1.1.2. i ඡේදය හා 1.1.3 ඡේද අවලංගු කර ඒ වෙනුවට පහත සඳහන් ඡේද ආදේශ කරනු ලැබේ.

1.1.2. අතිකාල හා නිවාඩු දින වැටුප්

i අතිකාල ගෙවීම්

පුරප්පාඩු තනතුරු සඳහා මේ වන විට විශාල වශයෙන් අවශ්‍ය සේවකයන් බඳවා ගැනීම් සිදු කර ඇති බැවින්, අත්‍යාවශ්‍ය හා විශේෂ අවස්ථාවල දී පමණක් අතිකාල දීමනා ගෙවීමට කටයුතු කළ යුතු අතර අදාළ මාසය නිම වීමට පෙර කිසිදු අතිකාල ගෙවීමක් එම මාසය වෙනුවෙන් නොකළ යුතුය. කාර්යාල සේවාවන් අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා සලසා ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අත්‍යාවශ්‍ය අවස්ථාවන්හිදී පමණක් අදාළ අමාත්‍යාංශ ලේකම්/ ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ නිර්දේශය හා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත අතිකාල හා නිවාඩු දින වැටුප් (වැය විෂයය අංකය 1002) වැය විෂයය සඳහා ප්‍රතිපාදන පළාත් මූල්‍ය රීතිවල සඳහන් විධිවිධානයන්ට අනුව මාරු කිරීම් කළ හැක.

1.1.3. ඉන්ධන, විදුලිය හා ජලය සහ ප්‍රවාහන වියදම්

කාර්යාල සේවාවන් අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා සලසා ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අත්‍යවශ්‍ය අවස්ථාවන්හිදී අදාළ අමාත්‍යාංශ ලේකම්/ ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ නිර්දේශය හා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත ඉන්ධන, විදුලිය හා ජලය සහ ප්‍රවාහන වියදම් (වැය විෂයය අංක 1202, 1403 හා 1401) වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන පළාත් මුල්‍ය රීතිවල සඳහන් විධිවිධානයන්ට අනුව මාරු කිරීම් කළ හැක.

04. ඒ අනුව CSO/FIN/3/5/2014-01 හා 2014.04.04 දිනැති බස්නාහිර පළාත් අයවැය චක්‍රලේඛ 4/2014 හි 1.1.2 ඡේදයෙහි ii හි සඳහන් විධිවිධානයන්, 1.1.3 ඡේදයෙහි i, ii, iii, iv හා v හි සඳහන් විධිවිධානයන් ඇතුළුව එම චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් සියලු විධිවිධානයන් එලෙසින්ම බල පැවැත්වේ.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත් :- 01. විගණකාධිපති
02. බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු
03. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
04. පරිගණක දත්ත ක්‍රියාකරු - වෙබ් අඩවියේ පල කිරීම සඳහා

| | පාලන | පිරිස් හා පුහුණු | මූල්‍ය | සැලසුම් | ඉංජිනේරු | අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන |
|---|---|---|---|---|---|---|